සැ. යු. - 2024.03.01 දින පළ කරන ලද අංක 2374 *ගැසට් පත්‍රයේ* IV(අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,374 - 2024 මාර්තු මස 07 වැනි බ්‍රහස්පතින්දා - 2024.03.07**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු .... ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 308 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |

### සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12 00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට්* පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2024 මාර්තු 28 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 මාර්තු 15 වැනි දින දහවල් 12 00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පළාත් පාලන නිවේදන

## දිඹුලාගල ප්‍රාදේශීය සභාව

දිඹුලාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වරිපනම් දේපළ මත වරිපනම් බදු ප්‍රතිශතය නිවේදනය කිරීම

දිඹුලාගල ප්‍රාදේශීය සභාවේ බලතල කාර්යය කර්තව්‍ය ක්‍රියාත්මක කරන ලේකම් වන එස්. එම්. කේ. වීරකෝන් වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 134(1) උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව දිඹුලාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වරිපනම් දේපළ මත 3% ක වරිපනම් බද්දක් පනවා අය කිරීමට උතුරු මැද පළාත් ගරු ආණ්ඩුකාරවර අනුමැතිය ලැබී ඇති බව මෙයින් නිවේදනය කරමි.

එස්. එම්. කේ. වීරකෝන්,<br>ලේකම්,<br>බලතල කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරී,<br>දිඹුලාගල ප්‍රාදේශීය සභාව.

03-110/1

---

## විෂයභාර අමාත්‍යවරයාගේ විධානය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 134(1) උපවගන්තියෙන් ලේකම් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර දිඹුලාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ දේපළ මත වාර්ෂික වටිනාකමින් 3% වාර්ෂික වරිපනම් බද්දක් පනවා අය කිරීම සඳහා දිඹුලාගල ප්‍රාදේශීය සභාවේ බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කරන දිඹුලාගල ප්‍රාදේශීය සභාවේ ලේකම් වන එස්. එම්. කේ. වීරකෝන් ගෙන ඇති තීරණය අනුමත කරනු ලබන්නේය.

මහීපාල හේරත්,<br>ආණ්ඩුකාරවර,<br>පළාත් පාලන විෂයභාර අමාත්‍ය,<br>උතුරුමැද පළාත,<br>අනුරාධපුර.

03-110/2

---

## ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා නව ඌරුමස් වෙළඳ සැලක් පවත්වාගෙන යාමට බලපත්‍රයක් නිකුත් කිරීමට එරෙහිව විරෝධතා කැඳවීම

මෙහි පහත උපලේඛනයේ නම සඳහන් අය විසින් උපලේඛනයේ සඳහන් ස්ථානයේ ඌරුමස් විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම සඳහා ඉල්ලීමක් මා වෙත ඉදිරිපත් කර ඇති බවත්, එම බලපත්‍රය ලබා දීම පිණිස ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි තැනැත්තන් විරුද්ධ වන්නේ නම් එසේ විරුද්ධ වීමට තිබෙන කරුණු පිළිබඳ ලිඛිත ප්‍රකාශනයක් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV(ආ) කොටසේ පළ වූ දින සිට දින 07ක් ඇතුළත මා වෙත ඉදිරිපත් කළ යුතු බව ගෝ ඝාතක ආඥාපනතේ අංක 7(2) වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එච්. එම්. නිරෝෂා හේරත්,<br>ලේකම්,<br>ප්‍රාදේශීය සභාව,<br>ඉබ්බාගමුව.

2024 පෙබරවාරි මස 27 වැනි දින,<br>ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *ඌරුමස් වෙළඳ සැල පවත්වාගෙන යාමට ඉල්ලුම් කළ තැනැත්තාගේ නම සහ ලිපිනය* | *ඌරුමස් වෙළඳ සැල පවත්වාගෙන යාමට අදහස් කරන ස්ථානයේ ලිපිනය හා හඳුනා ගැනීමේ විස්තර* | *ග්‍රාම නිලධාරී වසම හා අංකය* |
|---|---|---|
| ඩබ්. ඒ. ශ්‍රියාකාන්ති පීරිස් මිය,<br>දූව සංස්ථාව අසල,<br>මැල්සිරිපුර.<br>ජා.හැ.අංකය (197952110027) | මැලිසිරිපුර දූව සංස්ථාව පාරේ ඩබ්. ඒ. ශ්‍රියාකාන්ති පීරිස් මහත්මියට අයත් කඩ කාමරය | 502 - මැදමුල්ල |

03-163

---

**බලපිටිය ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වන වගන්තිය ප්‍රකාරව බලපිටිය ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපති එන්. සමන් ද සිල්වා විසින් 2021/02/19 දිනැතිව අංක 2216 දරන *ගැසට් පත්‍රයේ* IV(ආ) කොටස - පළාත් පාලන නිවේදන යටතේ පිටු අංක 370 හි පළ කරනු ලැබූ පහත උපලේඛනයේ සඳහන් මාර්ගය බලපිටිය ප්‍රාදේශීය සභාව සතු මාර්ගයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමේ දැන්වීම, බලපිටිය මහාධිකරණයේ නඩු අංක ආඥා 40/21 හා 2023/08/11 දිනැති නඩුවෙහි අවසාන නියෝගය පරිදි බලපිටිය ප්‍රාදේශීය සභාවේ ලේකම්ගේ අංක 2023/11/22/194(ix) හා 2023/11/22 දිනැති තීරණය පරිදි ඉවත් කර ගන්නා බව මෙයින් දන්වා සිටිමි.

**උපලේඛනය**

| *අනු. අංකය* | *මාර්ගයේ නම* | *දිග (කි.මී.)* | *පළල (මීටර්)* | *ආරම්භය* | *අවසානය* |
|---|---|---|---|---|---|
| 01 | බලපිටිය දිසා අධිකරණයේ බෙ/3177 නඩුවට අද ාළ අංක 2438 දරන පිඹුරේ කැබලි අංක 09 න් නිරූපිත මාර්ග | 0.350 | 03 | පේරුක් ඇළ මාවත | බෙ/3177 නඩුවට අදාළ අංක 2438 දරන පිඹුරෙන් නිරූපිත පෙරුමාදුරගේ වත්ත *හෙවත්* කළුපෙරුම වත්ත *හෙවත්* ළිඳමුල වත්තේ අංක 10, 11 කැබලි |

ආර්. එච්. එන්. සුරංගි දේශප්‍රිය,,
ලේකම්,
බලපිටිය ප්‍රාදේශීය සභාව,

2023 නොවැම්බර් 22 වැනි දින,
බලපිටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

03-106

---

**ගලිගමුව ප්‍රාදේශීය සභාව මාර්ග නම් කිරීම**

1975 අංක 04 දරන වීථි නම් කිරීම හා ස්මාරක පිහිටුවීම පාලනය කිරීම පනතේ විධිවිධාන අනුව සහ සබරගමුව පළාත් පාලන කොමසාරිස්ගේ අංක 1999/1 (නීති) හා 1999.03.28 දිනැති චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කිරීම සුදුසු බවට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව ගන්නා ලද ලේකම් තීරණයන්ට අනුව කටයුතු කිරීමට 1989 අංක 12 දරන අනුෂාංගික විධිවිධාන පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 198 වගන්තියෙන් පිරිනැමී

ඇති බලතල යටතේ සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ 2024.02.20 දිනැති අනුමැතිය පරිදි පහත උපලේඛනයේ 1 වන තීරුවෙන් විස්තර වන ගලිගමුව ප්‍රාදේශීය සභාව සතු බවට ප්‍රකාශයට පත් කර ඇති පොදු මාර්ග මින් ඉදිරියට එම උපලේඛනයෙහි 03 වන තීරුවේ විස්තර වන නමින් නම් කරන බව ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 9(3) උවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මෙයින් නිවේදනය කරමි.

එස්. ඒ. එස්. එම්. වික්‍රමසූරිය,
ලේකම් හා කාර්යය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
ගලිගමුව ප්‍රාදේශීය සභාව.

2024 පෙබරවාරි මස 20 දින,
ගලිගමුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| | *1 තීරුව* | *2 තීරුව* | *3 තීරුව* |
|---|---|---|---|
| *අනු. අංකය* | *වර්තමානයේ හඳුන්වන නම* | *ප්‍රකාශයට පත් කරන ලද ගැසට් නිවේදනය* | *යෝජිත නාමය* |
| 01 | ආසිදෙනිය දෙමටන්පිටිය හරහා කුඹුක්තොටුව පාර | 2001.01.26 දින අංක 1169 (අනු අංක 99) | "පූජ්‍ය අඹන්පිටියේ සරණපාල මාහිමි මාවත" (තීරණ අංක 2024/02/05/14) |
| 02. | දෙමටන්පිටිය යටගුලේ පාර | 1993.06.18 දින 772 (අනු. අංක 114) | "පූජ්‍ය යටගුලේ සරණංකර මාහිමි මාවත" (තීරණ අංක 2024/02/05/15) |
| 03. | දෙමටන්පිටිය ආසිදෙනිය පාර | 1993.06.18 දින අංක 772 (අනු අංක 111) | "පූජ්‍ය වැල්ලැවේ චන්ද්‍රානන්ද මාහිමි මාවත" (තීරණ අංක 2024/02/05/16) |

03-142

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.